සමුපකාර සේවක කොමිෂන් සභාව - බස්නාහිර පළාත
கூட்டுறவு ஊழியர்கள் ஆணைக்குழு - மேல் மாகாணம்
Co-operative Employees Commission - Western Provice

අංක 628, 8 වන මහල, ජනජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය
இல 628,8 ஆம் மாடி,ஜனஜய சிட்டி கட்டடம்,நாவல வீதி,ராஜகிரிய
No. 628, 8th Floor, Janajaya City Building, Nawala Road, Rajagiriya

සභාපති / தலைவர் / Chairman: 011-2885705 | ලේකම් / செயலாளர் / Secretary: 011-3667395 | පරිපාලන නිලධාරි / நிர்வாக அதிகாரி / Admin. Officer: 011-5231811 | කාර්යාලය / அலுவலகம் / Office: 011-2885705 | ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2885705 | ඊමේල්/மின்னஞ்சல்/Email: wpcoopec@gmail.com

මගේ අංකය / எனது இல / My Ref.: DO-01/01/2017
ඔබගේ අංකය / உங்கள் இல / Your Ref.:
දිනය / திகதி / Date: 2020.06.11

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

<u>අපි එනතුරු ගෙදර ඉන්න - වැඩසටහන ක්‍රියාත්මක කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මා වෙත යොමු කළ සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ 2020.05.26 දිනැති ලිපිය හා බැඳේ.

02. 2020.03.17 සිට 2020.05.26 දක්වා නව කොරෝනා වෛරසය ව්‍යාප්ත වී ගිය කාල පරිච්ඡේදය තුළ සිදුව ඇති අවදානම නොතකා ඔබ සමිති වල කාර්ය මණ්ඩල විසින් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බෙදාහැරීමේ කටයුතු වල නිරත වීම අගය කොට සලකමි.

03. ඔබ කාර්ය මණ්ඩල වෙත නිසි ඇගයීමක් කර, යම් දීමනාවක් ගෙවීමට සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ නිර්දේශය සහිතව ඉහත ලිපිය මා වෙත එවා ඇත. එම ලිපියේ පිටපතක් මේ සමග අමුනා එවමි. ඒ අනුව, අදාල පරිදි කාර්ය මණ්ඩල වෙත දීමනා ගෙවීමට කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත.

04. ඒ අනුව, අවශ්‍ය කටයුතු කරන ලෙස කොමිෂන් සභා නියමය පරිදි දන්වා සිටිමි.

සුමිත් සූරවීර
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත: සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් -(බස්නාහිර පළාත)-කාරුණික දැ.ගැ.පි.

Telephone
2329102
2348228

ෆැක්ස්
பெக்ஸ் இல.
Fax
2329270

විදුලි පණිවිඩ
தந்தி
Telegrams
සමුපකොම
கூட்டுறவாணை

My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
## බස්නාහිර පළාත
තැ.පෙ444,ආදිපාද වීදිය,කොළඹ 01.

கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
மேல் மாகாணம்,
தபாற் பெட்டி 444, டியூக் வீதி, கொழும்பு 01

DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT
WESTERN PROVINCE
P.O.Box.444, Duke Street , Colombo 01

28 MAY 2020

2020.05.26

ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)

<u>"අපි එනතුරු ගෙදර ඉන්න" වැඩසටහන ක්‍රියාත්මක කිරීම</u>

කොවිඩ් 19 වසංගතය තත්ත්වය පාලනය කිරීම සඳහා රජය මගින් ගන්නා ලද ක්‍රියාමාර්ග ඉටුකිරීම ප්‍රමුඛ කරගනිමින්, ඇඳිරි නීතිය අඛණ්ඩව බස්නාහිර පළාත තුල ක්‍රියාත්මක කරන ලද අවස්ථාවකදී, බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති සමුපකාර සමිතිය මගින්, කොවිඩ් 19 රෝග බිය අමතක කරමින්, දිවා රාත්‍රී වෙහෙසෙමින් රටේ මහජනතාවට අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය බෙදා හැරීමේ කාර්යයන්ට (පාරිභෝගික හා ඉන්ධන අංශ) සක්‍රියව දායක වෙමින් කරන ලද කාර්යය භාරය තුල අදාල කාර්ය මණ්ඩලය නිසි ඇගයීමක් කර ඔවුන් වෙත යම් දීමනාවක් ලබාදීම කල යුතුවේ.

02. මේවන විට යම් සමිතියක් විසින් විවිධ වූ දීමනා ක්‍රම අනුව මෙම කාලය තුල කාර්ය මණ්ඩලයට යම් දීමනාවක් ගෙවීම් කර තිබේනම් එම දීමනා ක්‍රම සියල්ල ඒකාකාරී බවකින් යුතුව පවත්වාගැනීමද මෙහි අරමුණකි.

03. ඒ අනුව, බස්නාහිර පළාත තුල පැවති ඇඳිරි නීති කාල සීමාව තුල සේවය කරන ලද කාර්ය මණ්ඩලය සඳහා පහත සඳහන් පරිදි දීමනා ගෙවීම නිර්දේශ කරන අතර ඒ සඳහා අනුමැතිය ලබාදීම සිදුකර සමිති දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

I. 2020.03.17 දින සිට 2020.03.31 දින දක්වා දින 07 ක සේවා මුර සම්පූර්ණ කර ඇති පිරිස සඳහා මාසික වැටුපෙන් ¼ ක් ක අමතර දීමනාවක් සහ සේවා මුර ඉක්මවා සේවය කර ඇති කාල සඳහා අතිකාල දීමනා

II. 2020.04.01 සිට 2020.04.30 දින දක්වා දින 15 ක සේවා මුර සම්පූර්ණ කර ඇති පිරිස සඳහා මාසික වැටුපෙන් $^{2}/_{3}$ ක අමතර දීමනාවක් සහ සේවා මුර ඉක්මවා සේවය කර ඇති කාල සඳහා අතිකාල දීමනා

III. 2020.05.01 දින සිට 2020.05.26 දින දක්වා දින 10 ක සේවා මුර සම්පූර්ණ කර ඇති පිරිස සඳහා මාසික වැටුපෙන් ½ ක් ක අමතර දීමනාවක් සහ සේවා මුර ඉක්මවා සේවය කර ඇති කාල සඳහා අතිකාල දීමනා

රුවිනි ඒ. විජයවික්‍රම
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (වැ.බ.)
බස්නාහිර පළාත

<u>පිටපත</u>

1. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර) - දැ.පි.
2. ගරු සභාපතිවරු, බස්නාහිර පළාත් සියළුම විවිධ සේවා සමුපකාර සමිති - දැ.පි.
3. ගරු සභාපතිවරු, බස්නාහිර පළාත් සියළුම ග්‍රාමීය බැංකු සංගම් - දැ.පි.
4. ගරු සභාපතිවරු, ගම්පහ දිස්ත්‍රික් සමුපකාර ආරෝග්‍යශාල සමිති - දැ.පි.